# ශ්‍රී ලංකාවේ පාසල් ළමයින්ගේ අයිතිවාසිකම් සුරැකීමෙහි ලා ගුරුවරුන්ගේ කාර්යභාරය පිළිබඳ කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

( උතුරුමැද පළාත ඇසුරිණි )

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ
අධ්‍යාපන දර්ශනපති පාඨමාලාව සඳහා ඉදිරිපත් කරන
පර්යේෂණ කෘතියයි

UCLIB
538305

2005.09. 30
අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය,
කොළඹ.

අයි.එම්.කේ.බී. ඉලංගසිංහ,
ශාස්ත්‍රවේදී උපාධි,
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා,
පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා,
අධ්‍යාපනපති උපාධි,
නීතිවේදී උපාධි,
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ.
**2000/M . phil /04**

University of Colombo
Library

# සාරාංශය

පාසල් දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙහි ලා ගුරුවරුන්ගේ කාර්යභාරය අද සුවිශේෂී ගැටලුවක් බවට පත්ව ඇත. මේ සම්බන්ධව ශ්‍රී ලංකාවේ පර්යේෂණ සිදුකර නොමැත. මේ පිළිබඳව පර්යේෂණ සිදු කිරීම තුළින් වර්තමාන පාසල් පද්ධතිය තුළ ගුරුවරයාගේ භූමිකාව හා සිසු භූමිකාව කුමන තත්ත්වයක පවතී ද? ඒ සම්බන්ධව පවතින ගැටලු කවරේ ද? මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා රජය මඟින් ලබා දී ඇති විසඳුම් මොනවා ද? ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ අපගේ පාසල් වල සක්‍රිය අංශය වන ගුරුවරුන්ගේ හා සිසුන්ගේ තත්ත්වය කුමන මට්ටමක පවතී ද? දැනට අධ්‍යාපන අමාත්‍යාංශය හා රජය අනුගමනය කරන ක්‍රියා මාර්ග තුළින් ශිෂ්‍ය අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ගුරුවරුන්ට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථකව පවත්වාගෙන යෑමට අවශ්‍ය වාතාවරණය සැලසී තිබේ ද? යනාදී කරුණු මෙම අධ්‍යයනය තුළින් සොයා බැලේ. මෙම සියලු කරුණු පිළිබඳව සලකා බලා සිසුන්ගේ අයිතිවාසිකම් ද සුරකිමින් අධ්‍යාපන ක්‍රියාවලිය සාර්ථක ලෙසට පවත්වාගෙන යා හැකි අන්දම පිළිබඳව විශේෂයෙන් විමසා බැලේ. මෙහි ඇතුළත් තොරතුරු වර්තමාන පාසල් පද්ධතියට හා ලංකාවේ අර්බුදකාරී තත්ත්වයක පත්ව ඇති පාසල් පද්ධතියේ ගැටලු නිරාකරණය කිරීම කාලෝචිත වේ. පාසල් ළමයින්ගේ අයිතිවාසිකම් සුරැකීමෙහි ලා ගුරුවරුන්ගේ කාර්යභාරය පිළිබඳව උතුරු මැද පළාත ආශ්‍රයෙන් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යනයක් ලෙසට මෙම අධ්‍යනය සිදු කෙරේ. ළමා අයිතිවාසිකම් පිළිබඳව අර්ථ දැක්වීම් හා ගුරුවරුන්ගේ කාර්ය භාරය පිළිබඳව විග්‍රහ කරමින් දෙපාර්ශවයේ ගැටලු හඳුනා ගැනීමටත්, එම ගැටලු අතුරින් වර්තමාන පාසල් පද්ධතිය තුළ බහුලව දැකිය හැකි ප්‍රශ්න සොයා බැලීමත් මෙම අධ්‍යයනයෙන් සිදු කර ඇත. ළමා අයිතිවාසිකම් කඩවීමට හේතු හා එසේ වීමට බලපානු ලබන විවිධාකාර සමාජ පසුතලයන් හා සංසිද්ධි කෙරෙහි ද අවධානය යොමු කරමින් මෙම අධ්‍යයනය සිදු කර තිබේ.

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ශ්‍රී ලංකාවේ හා දකුණු ආසියාවේ අනිකුත් රටවල පාසල් ළමයින් කෙරේ බලපවත්නා නෛතික රෙගුලාසි ඉංග්‍රීසි නීතියෙන් හා පොදු නීතියේ විනිශ්චිත නඩු තීන්දු ආශ්‍රයෙන් පාසල වෙත පැවරෙන සුපරීක්ෂාකාරිත්වයේ වගකීම පිළිබඳව ද මෙම අධ්‍යයනයේ දී ගැඹුරින් සාකච්ඡා කර ඇත. උතුරු මැද පළාතේ, ජාතික පාසල්, 1 AB පාසල්, 1C වර්ගයේ පාසල්, 2 වර්ගයේ පාසල් හා 3 වර්ගයේ පාසල් අදාළ නියැදි ලෙසට තෝරාගෙන ඇත. එම පාසල් වල විදුහල්පතිවරුන්, ගුරුවරුන්, සිසුන්, පාසල් හැරගිය අය ආදී සියලුම කාණ්ඩ අයත් වන ලෙසට ප්‍රශ්නාවලිය මඟින් තොරතුරු ලබාගෙන, පාසල් මට්ටමේ දී පාසල් දරුවන්ගේ අයිතිවාසිකම් කඩවීම් යනුවෙන් ඔවුන් සංජානනය කරනු ලබන කරුණු හා එසේ වීමට හේතු සහ එකී අයිතීන් කඩවීම් නතර කිරීමට ගතහැකි ක්‍රමෝපාය ගැන අවධානය යොමු කර ඇත. උතුරු මැද පළාතේ සිසුන්ගේ, දෙමාපියනගේ පාසල් ප්‍රජාවගේ ද ගුරුවරුන්ගේ ද අදහස් සැලකිල්ලට ගෙන තොරතුරු විශ්ලේෂණය කර ඇති අතර, ළමා අයිතිවාසිකම් වලට අදාළ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තිය හා මේ සම්බන්ධව ලියවී ඇති නෛතික ග්‍රන්ථ මාතෘකාවට අදාළව සිදු කර ඇති විදේශීය පර්යේෂණ හා අන්තර් ජාලයෙන් ලබාගත් තොරතුරු ද ආශ්‍රයෙන් ශ්‍රී ලංකාවේ පාසල් දරුවන්ගේ අයිතීන් ද රැකදෙමින් ගුරුවරුන් ක්‍රියාකළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව අදහස් හා යෝජනා මෙම පර්යේෂණ කෘතියෙන් ඉදිරිපත් කර ඇත. පර්යේෂණයේ දී ගුරු සිසු,




Library

විදුහල්පති අධ්‍යාපන බලධාරීන්ගේ හා දෙමපියන්ගේ අවධානය යොමු විය යුතු කරුණු රැසක් අනාවරණය විය. නාගරික පාසල්වලට වඩා ග්‍රාමීය පාසල් වල ළමා අයිතීන් බහුලව කඩවන බව ද, එයට හේතුව කළමනාකරණ දක්ෂතා ඇති විදුහල්පතිවරුන්ගේ හා විධිමත් පුහුණුවක් ලැබූ ගුරුවරුන්ගේ මෙන්ම භෞතික සම්පත්වල හිඟය බව ද අනාවරණය විය. අයිතීන් උල්ලංඝනය වීමේ දී පාසල් වල වර්ගය මත වෙනස් නොවුන ද විදුහල්පතිවරුන්ගේ දක්ෂතාවය හා කළමනාකරණ කුසලතාව ළමා අයිතීන් කඩවීම බලපෑම් එල්ල කරන බව අනාවරණය විය. ළමා අයිතීන් කඩවීම සඳහා ගුරුවරුන්ගේ,, ළමයින්ගේ, දෙමාපියන්ගේ මෙන්ම අධ්‍යාපන බලධාරීන්ගේ ද නොසැලකිල්ල හේතුවක් වන බව ද පෙනී ගියේ ය. පාසල ආරම්භයට පෙර, පාසල නිම වූ පසුව, වැඩි වශයෙන් ළමා අයිතීන් කඩවන බව ද, පාසලේ, ක්‍රීඩාපිටිය, ආපනශාලාව, සනීපාරක්ෂක පහසුකම් සහිත ස්ථාන හා විද්‍යාගාර, වැනි ස්ථානවල දී ද අයිතීන් කඩවීමේ වැඩි ප්‍රවනතායක් දැකිය හැකි වේ. එයට හේතුව ගුරු භවතුන්ගේ, ශිෂ්‍ය නායකයන්ගේ හෝ වෙනත් අයගේ සැලසුම්ගත මඟ පෙන්වීමක් එම ස්ථානවල නොතිබීමය. ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ කෲරභාවය හා ළමා කාලයේ දී ඔවුන් විඳ ඇති අමිහිරි අත්දැකීම් නිසාම වර්තමානයේ සිසු පරපුර අයිතිවාසිකම් කඩවන තත්ත්වයට වැටී ඇති බවට තොරතුරු අනාවරණය විය. ළමුන්ගේ සාධනමට්ටම් ඉහළ නැංවීම සඳහා ශාරීරික හා මානසික දඬුවම් ලබාදුන්න ද ඊට සාපේක්ෂව සාධනය ඉහළ ගොස් නැත. ප්‍රාථමික පංති වල දරුවන් හට මානසික දඬුවම් දීම ද ඉහළ පංතිවල දරුවන්ට ශාරීරික දඬුවම් දීමට ද විදුහල්පතිවරුන් හා ගුරුවරුන් කටයුතු කරන බව අනාවරණය විය. සිසුන්ගේ ඇදහැලීම් අනුපාතය අදහස්වලින් අධ්‍යාපනය ඉහළ යෑම සඳහා ආර්ථික හා පාරිසරික ප්‍රශ්න ද හේතුවන මුත් 42% පමණ හේතු වී ඇත්තේ ගුරුවරුන්ගේ ශාරීරික දඬුවම්, තර්ජන හා කෲරකම් බවට තොරතුරු හෙළිදරව් විය. විශේෂයෙන් ගුරුවරුන් හා විදුහල්පතිවරුන් නිවාඩු ගැනීම හා අයිතිවාසිකම් කඩවීම අතර ධනාත්මක සබඳතාවයක් පවතී. දරුවන්ගේ අයිතිය සුරක්ෂිත කරලීම සඳහා ගුරුවරුන්ට ඔවුන්ගේ කාර්ය භාරය ගැන මනා පුහුණුවක් ලබාදීම ද, ළමා අයිතීන් ගැන හොඳ පුහුණුවක් ලබාදීම ද අවශ්‍ය වේ. විශේෂයෙන් පාසලේ දී ළමයා හැසිරිය යුතු ආකාරය පිළිබඳව පැහැදිලි මඟ පෙන්වීමක් පාසලට ඇතුලත් වන දවසේ සිටම අඛණ්ඩවම ලබාදිය යුතු ය.. ඒ සඳහා ගුරුවරුන් විසින් දෙමාපියන්ගේ ද සහය ලබාගත යුතු ය. පාසලේ පරිපාලන කටයුතු සඳහා දරුවන්ගේ ද සහය ලබා ගැනීම තුළින් ළමා අයිතීන් ආරක්ෂා කරමින් හොඳ පාසලක් පවත්වාගෙන යා හැකි බවට තොරතුරු අනාවරණය විය. දඬුවම් වෙනුවට කරුණු කියා දීම, මඟ පෙන්වීම, උපදේශනය ඉතා යහපත් ප්‍රතිඵල ගෙනදෙන බවට සඳහන් කළ හැකි ය.